ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VTY/D/SLBFE/01/18/36

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2019 නොවැම්බර් 14 දින

සභාපති

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයින්ට ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා අදාල ශ්‍රමිකයන්ගෙන් අයකරන ලද මුදලින් ගුවන්ටිකට්පත් මිලදී ගැනීමෙන් පසු ඉතිරිවූ රු. 2,615,836 ක මුදල අදාල ශ්‍රමිකයින්ට ගෙවිය යුතු ලෙස දැක්වීම වෙනුවට කාර්යාංශයෙහි ආදායමට ගෙන තිබුණි.

(ආ) කාර්යාංශයේ පරිගණකගත ගිණුම් පද්ධතියට අනුව, ලෙජර් ගිණුම්වල ඇතුලත් විදේශ විනිමය හුවමාරු වාසිය රු. 176,892,642 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු. 167,445,298 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව වර්ෂයේ ලාභය රු. 9,447,344 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂයේ ආදායම් බදු ප්‍රතිපාදනය රු. 486,647,581 ක් වුවද විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම් අනුව එම වටිනාකම රු. 476,881,608 ක් වී තිබුණි. ඒ අනුව වර්ෂයේ බදු වියදම රු. 9,765,973 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අනුව කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන සඵල පොළී අනුපාතික ක්‍රමය මත (Effective Interest Rate) ක්‍රමක්ෂය අගයට මැනීම සිදුකරන බව දක්වා තිබුණි. එසේ වුවද, ප්‍රකාශිත පොළී අනුපාතය (Coupon Interest Rate) මත ගණනය කරන ලද පොළිය ආයෝජන ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.

(ඉ) කාර්යාංශය විසින් විවිධ ණය යෝජනා ක්‍රමයන්ට අදාලව මූල්‍ය ආයතනයන්හි ඇප තැන්පතු වශයෙන් තබා ඇති එකතුව රු.328,071,264 ක් වූ ස්ථාවර තැන්පතු 10 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි නිසිපරිදි හෙලිදරව් කර නොතිබුණි.

(ඊ) 2018 ජනවාරි 01 සිට කල්පිරෙන තෙක් රඳවාගනු ලබන ආයෝජන සම්බන්ධයෙන් ගිණුම් තැබීම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 - මූල්‍ය උපකරණ (SLFRS 09) අනුගමනය කරමින් සිදුකල යුතු වුවත්, ඒ සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07 සහ ගිණුම්කරණ ප්‍රමිත 32 හා 39 SLFRS 07 සහ LKAS 32, 39 අනුගමනය කර ඇති බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ගෙවිය යුතුව තිබූ රු. 6,261,168 ක අධිභාර මුදලක් ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර ලැබීතිබුණත් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10 - වාර්තාකරන දිනෙන් පසුව සිදුවීම් ප්‍රකාරව අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඌ) කාර්යාංශය විසින් දිගුකාලීන සේවා ප්‍රතිලාභ අරමුදලට අදාලව පවත්වාගෙන ගොස් තිබුණු සැලසුම් වත්කමෙහි 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.151,637,722 ක් විය. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2018 වර්ෂයේ දී එය රු. 137,976,269ක් දක්වා අඩු කර තිබුණි. දිගුකාලීන සේවා ප්‍රතිලාභ අරමුදලකට අදාලව වත්කම් පවත්වාගෙන යාමේ අරමුණ ඉටුවන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 - සේවක ප්‍රතිලාභ (LKAS 19) අනුව මෙම වත්කම් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 - විදේශ නීතිමය හුවමාරු අනුපාතයෙහි වෙනස්වීම් හි 23 ඡේදය ප්‍රකාරව විදේශ විනිමය උපයෝගී කරගෙන සිදුකරන ගනුදෙනුවලට අදාල දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ එදිනට පැවති විනිමය අනුපාතය පදනම් කරගෙන පරිවර්තනය කළ යුතු වුවත් විගණන නියැදි පරීක්ෂණයට භාජනය වූ ඉදිරියට ගෙවීම් ගිණුමට අදාලව කාර්යාංශයේ ගිණුම්කරණ පද්ධතිය මගින් ගණනය කරන ලද එකතුව රු. 11,024,393 ක් වූ විදේශ විනිමය වාසිය සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඒ) රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන් සඳහා ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් කාර්යාංශයට ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 1,702,912 ක මුදල සම්බන්ධයෙන් අදාල මූලාශ්‍ර ලියවිලි සහ විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඔ) ගුවන් ටිකට්පත් වගකීම් ගිණුමට අදාල උපලේඛනයෙහි විදේශ රැකියා අමාත්‍යාංශයට ගෙවිය යුතු ලෙස 2017 හා 2018 වර්ෂයන්ට අදාලව පිළිවෙලින් රු. 929,361 ක හා රු. 812,593 ක ශේෂද 2018 වර්ෂයේ බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු ලෙස රු. 1,035,830 ක ශේෂයක්ද දක්වා තිබුණු අතර මෙම ගෙවීම් කුමන කාර්යයන් සඳහාද යන්න තහවුරු කර ගැනීමට අදාල සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

(ඕ) කාර්යාංශයේ නිළධාරීන්ට ලබාදෙන වෘත්තීය දීමනා, වාර්ෂික රක්ෂණ දීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා, විශේෂ ප්‍රසාද දීමනා, ප්‍රවාහන දීමනා, ණය පොලී ප්‍රතිපූර්ණ කිරීම, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට අමතරව, භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශය විසින් සකස් කරගත් නිර්ණායක මත ක්‍රම 06 ක් යටතේ එකතුව රු. 86,399,621 ක කාර්ය මණ්ඩල දීමනා ගෙවීමට කාර්යාංශය කටයුතු කර තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කාර්යාංශය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාංශය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත	
(i) 52 (1) වගන්තිය	බලපත්‍රලාභියකු විසින් ලබාගත් සෑම කොමිස් මුදලකින්ම සියයට 05 ක අනුප්‍රමාණයක් ගනන් බලනු ලැබූ සෙස් බද්දක් අයකරගත යුතු වුවද, විගමනය වන ගෘහ සේවිකාවන්ට විදේශීය හාම්පුතුන්ගෙන් ලැබෙන කොමිස් මුදල නොසලකා එක් විගමණික ගෘහ සේවිකාවක් වෙනුවෙන් රු.5,000 ක සෙස් බද්දක් පමණක් විධිමත් අනුමැතියකින් තොරව අය කර තිබුණි.
(ii) 42(2) වගන්තිය	කම්කරු සුභසාධන අරමුදල ආරම්භ කිරීමේ අරමුණුවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. 499,473,516 ක් කාර්යාංශයේ සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවා තිබුණි. ඊට අමතරව කාර්යාංශයේ වාර්ෂික පොදු වියදම් වලින් සියයට 5 ක් එනම් රු. 12,018,115 ක් මෙම අරමුදලට හර කර තිබුණි.
(iii) 48 (ඇ) වගන්තිය	රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයන් පුහුණු කිරීම සහ හුරු කිරීම සඳහා කම්කරු සුභසාධන අරමුදල උපයෝගී කරගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබුණු අතර රු. 1,308,838,726 ක් වූ සමස්ථ වියදමෙන් සියයට 22 ක් පමණක් විදේශගත ශ්‍රමිකයින්ගේ සුභසාධනය වෙනුවෙන් වැයකර තිබුණි.
(iv) පනතේ II කොටසේ 17 වන වගන්තියේ 3 වන උප වගන්තිය	කාර්යාංශ අරමුදල් වැය කළහැකි අරමුණුවලට පටහැනිව, විධිමත් අනුමැතියකින් තොරව කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ හා හදිසි අනතුරු වන්දි ලබාදීමේ රක්ෂණ ක්‍රමයක් 1995 වසරේ සිට ක්‍රියාත්මක කර තිබුණි. වාර්ෂිකව කාර්යාංශයේ ආදායම් උපයෝගී කරගෙන වෛද්‍ය බිල්පත් පතිපූර්ණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී පමණක් එකතුව රු.44,287,888 ක වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(v) 46(1) වගන්තිය	කම්කරු සුභසාධන අරමුදල නමින් වෙනම බැංකු ගිණුමක් මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඇති කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛයෙහි සඳහන් රු. 250,000 සීමාව ඉක්මවා කාර්යාංශය විසින් ආපදා ණය ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට කාර්යාංශයේ ආපදා ණය ශේෂයන්ගේ එකතුව රු. 325,149,295 ක් විය. එම ණය ශේෂ තුල රු. 500,000 කට වැඩි ආපදා ණය ශේෂ 137 ක් හා රු 1,000,000 ඉක්ම වූ ණය ශේෂ 04 ක් විය.
(ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2015 වර්ෂයේ අපහරණය කිරීමට නිර්දේශ කර තිබූ වාහන 27 කින් වාහන 15 ක් විගණන දිනය වූ 2019 නොවැම්බර් 01 දින වන විටත් අපහරණය කිරීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2006 වසරේ සිට 2016 ජනවාරී මාසය දක්වා කාලසීමාවට අදාලව සේවක අර්ථ සාධක අරමුදල් ගණනය කිරීමේදී කාර්යාංශයේ සේවකයන්ට ගෙවන ලද ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් කම්කරු කොමසාරිස්ගේ උපදෙස් අනුව සේව්‍ය හා සේවක යන දෙපාර්ශවයේම දායක මුදල් කාර්යාංශයෙන් ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව එකතුව රු.47,912,231 ක පමණ පාඩුවක් කාර්යාංශයට සිදු වී තිබුණි.

(ආ) කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන විදේශ දූත මණ්ඩලවල කම්කරු සුභසාධන අංශ 16 සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් හෝ බඳවා ගැනීමේ පරිපාටියක් නොමැතිව 2018 දෙසැම්බර් 31 දිනට නිළධාරීන් 135 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. එම නිළධාරීන්ගේ වැටුප්, දීමනා හා අනෙකුත් පහසුකම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. 663,811,831 ක් වැයකර තිබුණු අතර අනෙකුත් යටිතල පහසුකම් සහ රැඳවියන්ගේ සෘජු වියදම් වෙනුවෙන් රු. 80,771,306 ක් පමනක්

වැයකර තිබුණි. මේ අනුව දූත මණ්ඩලවල මුළු වියදමින් සියයට 89 ක් කාර්ය මණ්ඩලය නඩත්තු කිරීම වෙනුවෙන් වැය කර තිබුණි.

(ඇ) 1988 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ විගමණික ශ්‍රමික දායක අරමුදල ආරම්භ කිරීමේ අරමුණු පැහැදිලි වන කිසිදු ලිඛිත තොරතුරක් කාර්යාංශය සතුව නොතිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට විගමණික ශ්‍රමිකයන් 1,573 කට අයත් රු.7,954,452 ක ශේෂයක් පැවතුණි. එහෙත් ඊට අයත් ආයෝජන සහ ලැබිය යුතු වටිනාකම්වල එකතුව රු.5,775,029 ක් පමණක් වුයෙන් එම වගකීම පියවීමට ප්‍රමාණවත් වත්කම් අරමුදල සතුව නොතිබුණි. මෙම අරමුදලෙහි කළමනාකාරීත්වය සම්බන්ධයෙන් විධිමත් වැඩ පිළිවෙලක් නොතිබූ බැවින් අරමුදල අකර්මනාත්මත්වයට පත්වී තිබුණි.

(ඈ) 1990/1991 ගල්ෆ් යුද්ධය හේතුවෙන් එම කලාපයේ රැකියාවන් හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබී තිබූ වන්දි වලට අදාල අරමුදල් ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.3,184,109,533 ක් වූ අතර එම වන්දි හිමියන්ට ගෙවිය යුතු මුදල රු.251,453,848 ක් විය. මෙම වන්දි මුදල් කාර්යාංශයට ලැබී දැනට වසර 20 කට ආසන්න කාලයක් ගතවී තිබුණත් අදාල ප්‍රතිලාභීන් හඳුනා ගෙන ගෙවීමට කටයුතු කිරීමෙන් තොරව ආයෝජනය කර ආදායම් ඉපයීමට කටයුතු කර තිබුණි. එසේම අතිරික්ත අරමුදල් සම්බන්ධයෙන්ද කළමනාකාරීත්වය විසින් කිසිදු තීරණයක් ගෙන නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සහ කාර්යාංශයේ සහයෝගිතාවයෙන් විගමණික සේවකයන් සඳහා ක්‍රියාත්මක වූ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ, 2018 සැප්තැම්බර් 20 දින වන විට විගමණිකයන් 12,078 දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මගින් රු.මිලියන 3,557 ක ණය මුදලක් ලබා දී තිබුණි. ඉන් විගමණිකයන් 1,573 දෙනෙකු වෙත ණය ලබාදීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් තබා නොගෙන ලබා දී තිබූ රු.මිලියන 360.27 ක ණය ගෙවීම පැහැරහැර තිබුණි. මේ වන විට ගිවිසුමට අනුකූලව කටයුතු නොකිරීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හා පසු විපරම් කිරීමේ දුර්වලතා වැනි කරුණු හේතුවෙන් එම යෝජනා ක්‍රමය අකර්මනාත්මත්වයට පත්වී තිබුණි. එසේම ගිවිසුම ප්‍රකාරව කාර්යාංශය නමින් රු.මිලියන 100 ක් තැන්පත් කිරීම වෙනුවට ලංකා බැංකුවේ සමෘද්ධි අධිකාරිය නමින් රු.මිලියන 100 ක් තැන්පත් කිරීම හේතුවෙන් ඊට අදාල පොලියද 2014 වර්ෂයේ සිට කාර්යාංශයට ලැබී නොතිබුණි.

(ඊ) විදේශ රැකියා ක්ෂේත්‍රය තුල සිදුවන විවිධ අක්‍රමිකතා පාලනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මත කාර්යාංශයේ විශේෂ විමර්ශණ ඒකකය ආරම්භ කර 2018 දෙසැම්බර් 31 දින වන විට පොලිස් නිළධාරීන් 17දෙනෙකු ඇතුලත් කාර්යය මණ්ඩලය 36 දෙනෙකු එහි සේවයට අනුයුක්ත කර තිබුණි. විගණන නියැදි පරීක්ෂණයකට භාජනය වූ 2017 සහ 2018 වර්ෂවල මාස

13 ක කාලපරිච්ඡේදය තුල විදේශ රැකියා ලබා දෙන බවට පොරොන්දු වී වටිනාකම රු.108,463,384 ක මුදල් වංචා කිරීම් වලට අදාල පැමිණිලි 274 ක් එම ඒකකය වෙත ලැබී තිබුණි. විදේශ රැකියා ලබාදීමට පොරොන්දු වූ බවට ලිඛිතව තහවුරු කල නොහැකි වූ බැවින් එම පැමිණිලි එම ඒකකයේ සටහන් කර අදාළ ප්‍රදේශවල පොලිස් ස්ථාන වෙත යොමු කර තිබුණි. විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂනයට අනුව පැමිණිලි 20 කින් පැමිණිලි 19 කටම විසඳුම් ලැබී නොතිබුණි.

(උ) වීසා ලැබීමෙන් පසුව විදේශගත වීම ප්‍රතික්ෂේප කරන විගමණිකයින්ගෙන් තම රැකියා ඒජන්සිවලට ගෙවිය යුතු බවට තීරණය කර තිබූ රු.10,000 ක ගාස්තුව විධිමත් පදනමකින් සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව 2017 පෙබරවාරි 14 දින සිට රු. 25,000 ක් දක්වා වැඩිකර තිබුණි.

(ඌ) කාර්යාංශ පනතට අනුව රැකියා සඳහා විදේශගතවන ශ්‍රමිකයන් පුහුණු කිරීම මඟින් කාර්යාංශයට ආදායම් ඉපයීමට හැකියාවක් නොමැති වුවත් කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.74,985,198 ක ලාභයක් උපයාගෙන තිබුණි. එසේම පුහුණු ගාස්තු තීරණය කිරීමට විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු බැවින් අවශ්‍යතාවය ඉක්මවා ගාස්තු අයකර තිබුණි.

(එ) ගෙවිය යුතු වියදම් ලෙස 2015 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එමින් පවතින විගමණිකයන්ගෙන් අයකරගන්නා ලද කොරියානු වීසා ගාස්තු රු. 6,640,400 ක් ද ,විදේශ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි ගාස්තුවෙන් නැවත ගෙවිය යුතුව තිබූ එකතුව රු. 149,826,492 ක් ද, තංගල්ල පුහුණු මධ්‍යස්ථානය වෙනුවෙන් ගෙවිය යුතු කුලී රු. 39,060,000 ක් ද, ආහාර සැපයුම්කරුවන් වෙත ගෙවිය යුතු රු. 1,776,569 ක් ද, සමාලෝචිත වර්ෂය නිමවන විටත් නිරවුල් කිරීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(ඒ) 2013 වර්ෂයේ සිට කාර්යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන ඕමාන් තානාපති කාර්යාලය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අයවිය යුතුව තිබූ එකතුව රු. 67,568,640 කුලී මුදල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ආදායමින් කපා හැර තිබුණි.

(ඔ) 2016 වර්ෂයේ ආරම්භ කරන ලද 2017 අප්‍රේල් මාසයේදී වැඩ නිමකිරීමට සැලසුම් කල කතරගම නිවාඩු නිකේතනයේ ඉදිකිරීම් කටයුතු රු. 119,617,558 ක පිරිවැයක් දරමින් නිම කර 2019 අගෝස්තු 28 භාරදුන් බව විගණනයට දන්වා තිබුණි. එහෙත් ප්‍රමාණවත් ජල පහසුකම් නොමැති වීම මත එම නිවාඩු නිකේතනය විගණන දිනය වූ 2019 නොවැම්බර් 01 දින වන විටත් භාවිතයට ගැනීමට නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.

(ඕ) කාර්යාංශය විසින් 2018 අප්‍රේල් 02 වන දින රු. 6,817,974 ක් පිරිවැය වූ භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීමෙන් පසු ප්‍රතිමිලදී ගැනීමක් සිදුකර තිබුණු අතර ඒ පිළිබඳ තොරතුරු අදාල ගිණුම්වල

සටහන් වී නොතිබුණි. එමෙන්ම ඊට අදාල රු. 9,571 ක ආයෝජන ආදායම බැංකු ගිණුමට ලැබී තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

(ක) 2018 දෙසැම්බර් 24 දින ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පැවති ඉතිරි කිරීම් ගිණුමෙන්, ලංකා බැංකු ආයතනික ශාඛාවේ පැවති ජංගම ගිණුමට මාරු කර තිබූ රු. 23,000,000 ක මුදල දින 07 කට පසුව අදාල ගිණුමට බැර වී තිබුණි. එහෙත් ඒ පිළිබඳ බැංකු ශාඛාවෙන් විමසීමට 2019 පෙබරවාරි 02 දින දක්වා ප්‍රමාද කර තිබුණි. ඉහත මුදල ජංගම ගිණුමට බැර නොවූවද, එම ගිණුමෙන් සිදුකල යුතුව තිබූ ගෙවීම් පියවා ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රමාණය ඉක්මවා රු. මිලියන 43 ක පමණ ශේෂයක් එම ගිණුමෙහි පැවති බව 2018 දෙසැම්බර් 24 සිට 2019 ජනවාරි 02 දින දක්වා ඊට අදාල දෛනික ගනුදෙනු පරීක්ෂාවේදී අනාවරණය විය.

(ග) කුවේට් හා කටාර් රාජ්‍යයන් වෙත රැකියා සඳහා ශ්‍රමිකයන් යොමුකිරීමේදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහතිකය මත යොමුකළ යුතුව තිබූ පොලිස් නිෂ්කාශන වාර්තා සාමාන්‍ය ක්‍රමවේදයට අනුව අදාල පොලිස් ස්ථාන මගින් ගෙන්වා ගැනීමෙන් තොරව, රැකියා නියෝජිත ආයතන මගින් ලබාගෙන සහතික කර විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කර තිබුණි. මෙම ක්‍රියාවලිය තුල විවිධ අක්‍රමිකතා සිදුවීමට ඉඩ ප්‍රස්ථා සැලසී තිබුණු අතර රත්නපුර පොලිස් ස්ථානයෙන් අස්ථානගත වී ඇති බවට වාර්තා වී තිබූ පොලිස් වාර්තා පොතකින් නිකුත් කරන ලද ව්‍යාජ පොලිස් නිෂ්කාශන සහතික 35 ක් කාර්යාංශය විසින් සහතික කර විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කර තිබුණි. එමෙන්ම එසේ ව්‍යාජ සහතික ඉදිරිපත් කර තිබූ රැකියා නියෝජිත ආයතනයට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණු අතර ඉහත සඳහන් සිද්ධිය වාර්තා වීමෙන් පසුවද එම ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රමිකයන් 07 දෙනෙකු විදේශගත කිරීමට කාර්යාංශය පහසුකම් සපයා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති